සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2019
---------------------------------------------------------------------

සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කිලෝමීටර් 131.50 ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යායනය කිරීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කර තිබුණු අතර 2020 අගෝස්තු 05 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.1 ඡේදනයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය වැඩසටහන ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරනනේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාවට අනුව 2019 වර්ෂය සඳහා ණය දෙන නියෝජිතායතනය මඟින් ව්‍යාපෘතියට රු. මිලියන 445 ක මුදලක් ලබා දී ඇතත්, රු. මිලියන 218 ක මුදලක් පමණක් ණය ලෙස ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ණය ගිණුම රු. මිලියන 227 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | 2019 වර්ෂය සඳහා ව්‍යාපෘතිය සඳහා මුළු අරමුදල් සම්පාදනය රු. 488,291,683.34 වූ නමුත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 2019 වර්ෂය සඳහා රු. 218,455,012.00 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | තත්‍ය ණය ලබා දීම ව්‍යාපෘතිය මඟින් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2015 වසරේ සිට දෙහිඔිට - දැරණියගල - නූරි පාරේ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී රු. මිලියන 1.8 ක නොගෙවූ මැනුම් ගාස්තු ඉල්ලා තුන්වන පාර්ශවයක් විසින් නීතිමය පියවර ගෙන තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඒ මත පැන නගින අසම්භාව්‍ය වගකීම අනාවරණය කර නොතිබුණි. | ඇතිවිය හැකි වගකීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම. | සටහන් කරගත් අතර 2020 වර්ෂයේදී මෙම මුදල වගකීමක් ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව අසම්භාව්‍ය වගකීම හෙළි කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට පටහැනිව, 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාද පොලී ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන කිසිවක් සපයා නොතිබුණි. | වත්කම් සහ වගකීම් අවතක්සේරු වීම. | ගෙවන ලද වන්දි සඳහා පොලිය 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයේ උපචිත ලෙස දැක්වීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ප්‍රතිපාදන සැලසිය යුතුය. |

3. භෞතික කාර්ය සාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම. | නාඋල නගරය ඇතුළුව මහනුවර - යාපනය මාර්ගයේ කි.මී. 53+740 සිට කි.මී. 58+000 දක්වා කොටස පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ කටයුතු 2018 දෙසැම්බර් 04 දින ආරම්භ කර තිබුණි. 2020 | දුර්වල සැලසුම් හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල විසින් ණය මුදලේ ඉතිරි කොටස එක් මාර්ගයක් සහ පාලම් තුනක් වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කිරීමට අනුමැතිය | මාර්ගවල ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | සැප්තැම්බර් 4 වන විට වැඩ නිම කිරීමට අපේක්ෂිත නමුත් 2019 දෙසැම්බර් 31 දින වනවිට සියයට 63 ක ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණි. | | ලබා දී ඇත. | |
| (ආ) | පාලම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් දෙකක් ව්‍යාපෘතිය ආරම්භයේ දී ආරම්භ කිරීමෙන් තොරව 2019 ජුනි 05 සහ 2020 ජනවාරි 17 දින පුනරුත්ථාපනය කිරීම ආරම්භ කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ මුළු වියදම රු. මිලියන 78.1 ක් වූ අතර එයින් රු. මිලියන 23.7 ක් 2016 ජනවාරි සිට 2019 දෙසැම්බර් දක්වා කාලයට අදාළ විය. ඉහත පාලම් ඉදිකිරීම ව්‍යාපෘතිය ආරම්භයේදීම සිදු කළේ නම් මෙවැනි වියදම් වළක්වා ගත හැකිව තිබුණි. | දුර්වල සැලසුම් හේතුවෙන් ව්‍යාපෘතියේ පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | මුල් වැඩ විෂය පථයට අනුව, මාර්ග 06 ක් ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර ඉහත ව්‍යාපෘතියේ ඉතිරි ණය මුදල පසුකාලීනව හඳුනා ගන්නා ලදී. ඒ අනුව අතිරේක කොන්ත්‍රාත් 04 ක් ක්‍රියාත්මක කිරීමට ණයදෙන ආයතනයේ එකඟතාවය ලබාගෙන ඇත. | මාර්ග සහ පාලම් කටයුතුවල ඉතිරි පුනරුත්ථාපන කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති උපදෙස්වලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකරය සැපයීමේ පිරිවැය අයකර ගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට මාර්ග පුනරුත්ථාපනය කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් සකස් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 2.4 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ට අනිසි වාසි අත්වීම. | කොන්ත්‍රාත්තුවේ කොන්දේසියට අනුව, කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්ය සාධන ඇපකරය සැපයිය යුතුය. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් ප්‍රමාණ පත්‍ර අයිතමවල එය දක්වන අතර, එසේ නොමැති නම්, කොන්ත්‍රාත්කරුවන් මෙම පිරිවැය ප්‍රමාණපත්‍රයේ වෙනත් අයිතමවලට ඇතුළත් කිරීම/බෙදා හැරීම සිදුකරනු ඇත. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2012 වර්ෂයේදී ආරම්භ කළද, එම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී. 2019 දෙසැම්බර් 31 දිනට වන්දි වශයෙන් රු. මිලියන 67.4 ක් සහ ඉඩම් කට්ටි 1,449 න් ඉඩම් කට්ටි 5 ක් සඳහා ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 3.2 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතිය විසින් 2019 දෙසැම්බර් 31 දින වනවිට පවා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඉඩම් කැබලි කිසිවක් ලියාපදිංචි කර නොතිබුණි. | හිමිකම් පියවීම් ප්‍රමාද වීම හේතුවෙන් වන්දි සඳහා පොලී පිරිවැය වැඩි වීමට ඇති හැකියාව. | ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කමිටුව (LARC) සඳහා ගෙවිය යුතු පොලී ගෙවීමෙන් පසු ඉඩම් ලියාපදිංචි කළ යුතු අතර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒ පිළිබඳ ප්‍රමාදයක් පවතින අතර එම කටයුතු කඩිනම් කිරීම සඳහා ඔවුන් වෙත සිහි කැඳවීම් දැනටමත් යවා ඇත. | වන්දි ගෙවීමට කඩිනම් පියවර ගත යුතු අතර ඒ සඳහා වන අමතර වියදම් වළක්වා ගතයුතුය. |